# Lesson 26

## ක්‍රියා නාම පදයක් (භාව ක්‍රියාව) උක්තය ලෙස සහ අනුක්තය ලෙස යෙදීම
## (The Gerund As Subject and As Object)

**Gerund** යන්න නාම පදයක් ලෙස භාවිත කරන ක්‍රියා පදයක් ලෙස සිතන්න. නාම පද මෙන් **Gerund** ද උක්තය, අනුක්තය හෝ වාක්‍යයක් සම්පූර්ණ කරන කොටසක් ලෙස යෙදිය හැකිය.

උදාහරණ :

**Smoking** costs a lot of money.
දුම් පානය බොහෝ මුදල් වැය කරයි.

I don't like **writing**.
මම ලිවීමට අකමැත්තෙමි.

My favourite hobby is **reading.**
කියවීම මාගේ ප්‍රියතම විනෝදාංශයයි.

එහෙත් ක්‍රියාවකට මෙන් ක්‍රියා නාම පදයකටද කර්ම පදයක් ඇතිව යෙදිය හැකිය. එහේවූ කල සම්පූර්ණ කියමනම (**Gerund +** අනුක්තය ) උක්තය ලෙස, අනුක්තය ලෙස හෝ වාක්‍ය සම්පූර්ණ කොටස ලෙස යෙදිය හැකිය.

උදාහරණ:

**Smoking** cigarettes costs a lot of money.
සිගරැට් පානය කිරීම බොහෝ මුදල් වැය කරයි.

I don't like **writing** letters.
මම ලියුම් ලිවීමට අකැමැත්තෙමි.

My favourite hobby is **reading** detective stories.
මා කැමතිම විනොදාංශය රහස් පරීක්ෂක කථා කියවීමය.